**ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව පිළිබඳව විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර, ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය අදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම් හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීනකර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශ කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම්කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128 (1) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුලත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.2.1 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |
| | | 4. ප්‍රතිපාදන ඉතුරුවීම් | 2.6 (අ)(ආ) |
| | | 5. අභ්‍යන්තර විගණනය | 2.10 |
| | | 6. වෙනත් අමාත්‍යාංශවලින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය | 2.6 (ඇ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.5 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම් | 2.8<br>2.9 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසායාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු<br>2. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කිරීමේ අඩුපාඩු | 2.3<br>2.3(ඇ) |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශන හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.1.2 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අය කර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අය කර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීම. | 2.7 |

## 2. ප්‍රමාණාත්මක සහ වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

2016 වර්ෂයේ ජල මූලාශ්‍ර සංරක්ෂණ වැඩසටහනක් සහ 2017 වර්ෂයේ වැඩසටහනට අමතරව දිළිඳුකම පිටුදැකීමේ වැඩසටහන යන කාර්යභාර්යයන් ඉටු කිරීම සඳහා රු.මිලියන 23 ක ප්‍රතිපාදනද, පෙර වර්ෂය හා ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් “පුනරුදය” වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබුණු රු.මිලියන 63.3 ක ප්‍රතිපාදනද උපයෝජනය කර තිබුණි. එහෙත් එයින් රු.මිලියන 24 ක වියදමින් බෙදා දුන් බීජ සහ පැලවලින් රු.මිලියන 9.3 ක් වටිනා බීජ සහ පැල 467057 ක් රෝපණය නොවී හෝ විනාශ වී අසාර්ථක වී තිබුණි. මෙම විනාශ වූ පැල වෙනුවෙන් රු.මිලියන 1.5 ක වෙනත් අනුශාංගික වියදම්ද දරා තිබුණි.

**2.1.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත්, එම වාර්තාව 2018 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබාගැනීම**

**2.2.1 ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටුකර ගැනීම සඳහා රු.මිලියන 34.68 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 31.88 ක් උපයෝජනය කර තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදන සම්බන්ධයෙන් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රසම්පාදනය කරගත යුතු භාණ්ඩ හා සේවාවල ඒකක ප්‍රමාණයන් සඳහන් කර නොතිබුණි.

**2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

ඩෙස්ක්ටොප් පරිගණක 06 ක් රු.714,000 ක මිලදී ගැනීමදී සහ රු.352,000 ක වියදමෙන් පරිගණක ජාලගත කිරීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාහන උපයෝජනය**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වාහන 28 ක් පැවැති අතර, වාහන පහක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ආ) ඉන්ධන දහනය පරීක්ෂාව**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහන 33 ක ඉන්ධන දහනය වීම් පරීක්ෂා කර නොතිබුණි.

**(ඇ) නිෂ්ක්‍රීය වත්කම්**

අලුත්වැඩියා කල නොහැකි තත්ත්වයේ පවතින දෙපාර්තමේන්තුව සතු වාහන 03 ක් සහ වෙනත් ආයතනයන් සතු වාහන 02 ක්ද වසර දෙකක කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

**(ඈ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

දෙපාර්තමේන්තුව විසින් 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද දිස්ත්‍රික් කාර්යාල 02 ක සහ ප්‍රධාන කාර්යාලයේ එක් අංශයක භාණ්ඩ වර්ග 245 ක භාණ්ඩ අයිතම 1023 ක් සම්බන්ධයෙන් සමීක්ෂණය කළ බවට තහවුරු කිරීමට තථ්‍ය ශේෂය සටහන් කර නොතිබුණි.

**(ඉ)** **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව සතු කාර් රථයක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත වර්ෂයකට අධික කාලයක් මුදා හැර තිබුණු අතර, එය පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ)** **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයත් වාහන 05 ක් සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට (UNDP) අයත් වාහනයක් විධිමත් ලෙස පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

## 2.4 විසඳා නොතිබූ විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාලව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව<br>ඡේද අංකය | යොමුගත විෂයය |
|---|---|
| 3.4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කරගත යුතු භාණ්ඩ හා සේවාවල ඒකක ප්‍රමාණයන් සඳහන් කර නොතිබීම. |
| 3.5 | දෙපාර්තමේන්තු සතු පරිහරණය කළ නොහැකි වාහන තුනක් ඌන උපයෝජිතව පැවතීම. |
| 3.6 | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය නෛතික පසුබිම සැකසීම සහ ජාතික ඉඩම් පරිහරණ සැලැස්ම සැකසීම ඇතුළු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටු නොකිරීම. |

## 2.5 මහජනයා වෙත සේවා ඉටු නොකිරීම

දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර තිබුණද එහි මහජන පැමිණිලි භාර ගැනීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබූ නිසා පැමිණිලි යොමු කිරීමට තිබෙන අවස්ථා මඟහැරී තිබුණි.

## 2.6 කාර්යභාර්යයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුල දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳව තොරතුරු හා ඒ පිළිබඳව විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| ------- | ------------ | ------------ | -------------- | ---------- | ---------------- |
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 187.67 | 187.09 | 0.58 | 0.31 |
| | මූලධන | 50.30 | 42.96 | 7.34 | 14.60 |
| | **එකතුව** | **237.97** | **230.05** | **7.92** | **3.33** |
| 2014 | පුනරාවර්තන | 260.32 | 252.83 | 7.49 | 2.88 |
| | මූලධන | 52.65 | 48.65 | 4.00 | 7.60 |
| | **එකතුව** | **312.97** | **301.48** | **11.49** | **3.67** |
| 2015 | පුනරාවර්තන | 322.97 | 320.67 | 2.30 | 0.71 |
| | මූලධන | 65.00 | 55.99 | 9.01 | 13.86 |
| | **එකතුව** | **387.97** | **376.66** | **11.31** | **2.91** |
| 2016 | පුනරාවර්තන | 349.06 | 345.32 | 3.74 | 1.07 |
| | මූලධන | 70.01 | 63.63 | 6.38 | 9.11 |
| | **එකතුව** | **419.07** | **408.95** | **10.12** | **2.42** |
| 2017 | පුනරාවර්තන | 350.97 | 346.51 | 4.46 | 1.27 |
| | මූලධන | 53.55 | 49.04 | 4.51 | 8.43 |
| | **එකතුව** | **404.52** | **395.55** | **8.97** | **2.22** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

----------------------------

වැය විෂයයන් 09 ක් සඳහා එකතුව රු.මිලියන 41.2 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 35.65 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය වූ රු.මිලියන 5.5 ක ප්‍රතිපාදනය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ක සිට සියයට 68 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ආ) පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මඟින් ප්‍රතිපාදන සලසා ගැනීම**

--------------------------------------------------------------------

පුනරාවර්තන වැය විෂයයන් 02 කට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා රු.මිලියන 07 ක් පරිපූරක ඇස්තමේන්තු යටතේ ලබාගෙන තිබුණු අතර, එයින් රු.මිලියන 02 ක් හෙවත් පරිපූරක ඇස්තමේන්තුවෙන් සියයට 28 ක් ඉතිරිකර තිබුණි.

**(ඇ) වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------

ජනාධිපති ලේකම් කාර්යාලය හා ඉඩම් අමාත්‍යාංශය විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 51.78 ක් හා රු.මිලියන 25 ක් වශයෙන් එකතුව රු.මිලියන 76.78 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 43.88 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 32.9 ක් හෙවත් සියයට 43 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. මෙම ප්‍රතිපාදනය උපයෝජනය සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබාදුන් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල "පුනරුදය" වැඩසටහන මඟින් දිවයින පුරා බීජ සහ පැල බෙදා හැර තිබුණු අතර, එම වගාවන්ගෙන් සියයට 35 ක් විනාශ වී තිබුණි.

(ii) රු.මිලියන 25 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ ඉඩම් බැංකු ව්‍යාපෘතිය වෙනුවෙන් 2016 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 3.6 ක වියදමක් දරා පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කරගෙන තිබූ අතර එයින් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

**2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 22,000,000 | 21,858,176 | 14,500,000 | 17,995,716 | 69,000,000 | 62,810,781 |

**2.8 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන එක් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, අනෙක් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454 | පුත්තලම දිස්ත්‍රික් කාර්යාලයේ බඩු ලේඛන පොත යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

**2.9 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| ----------------------------------- | ----------- | ------------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | රු. | |
| (අ) මුදල් රෙගුලාසි 104 | 1,366,683 | සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ වාහන අනතුරු හතක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ද, වාහන දොළහක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා ද ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 1646 | - | ප්‍රවර්තන වර්ෂයේ ධාවනය කල වාහන පහකට අදාල ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් නොකිරීම. |

## 2.10 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව පිළියෙල කර තිබුණු අභ්‍යන්තර විගණන වැඩසටහනේ ඇතුලත්ව තිබුණු පහත සඳහන් කාර්යභාරයන් ඉටුකර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කර තිබේදැයි පරීක්ෂා කිරීම.
(ආ) ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදුවේදැයි පරීක්ෂා කිරීම.
(ඇ) ප්‍රාදේශීය කාර්යාලවල කටයුතු පරීක්ෂාව.
(ඈ) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල කටයුතු පරීක්ෂාව.
(ඉ) අත්තිකාරම් ගිණුම් කටයුතු පරීක්ෂා කිරීම.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්යමණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 301.96 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.477,033 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 34 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 558 | 519 | 39 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 97 | 79 | 18 |
| (v) | අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම | - | 01 | - |
| | එකතුව | 696 | 633 | 64 |

**2.11.2 අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

-----------------------------------------------------------------------

2002 වර්ෂයේදී ඉඩම් පරිහරණ සැලසුම් නිළධාරියෙකු ඉඩම් අමාත්‍යාංශය වෙත අවිධිමත් ලෙස මුදා හැර තිබුණි.